සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**ග්‍රාම නිලධාරි කාර්යාල කළමනාකරණ තරඟය- 2020**

ග්‍රාම නිලධාරි සේවය තුළින් අපේක්ෂිත මහජන සේවාවන් ප්‍රශස්ත ලෙස ඉටු කිරීමට හා ග්‍රාම නිලධාරි කාර්යාලවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කොටගෙන, ග්‍රාම නිලධාරි කාර්යාල හා රාජකාරී පරීක්ෂා කිරීමේ තරඟය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් 2020 වර්ෂයේදී පැවැත්වීම සඳහා, පහත දැක්වෙන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමට මෙම අමාත්‍යාංශය තීරණය කර ඇත.

02. පහත සඳහන් අංශ යටතේ මෙම ඇගයීම සිදු කෙරෙන අතර ඇගයීමට අදාල ආකෘති පත්‍ර මේ සමඟ එවා ඇත. ඒ අනුව උපයාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව 250 කි.

I. කාර්යාලය පවත්වාගෙන යාම - ලකුණු 40
II. රාජකාරි ලේඛන පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම - ලකුණු 130
III. වෙනත් කටයුතු හා නිර්මාණාත්මක උත්සාහයන් - ලකුණු 50
IV. මහජන සම්බන්ධතාවය හා තනතුරේ ගරුත්වය ආරක්ෂා කිරීම - ලකුණු 30

03. මෙම ඇගයීම පහත විස්තර වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම, දිස්ත්‍රික් මට්ටම සහ ජාතික මට්ටම යන අදියර තුනකින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටම**

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පරීක්ෂණ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ප්‍රාදේශීය ලේකම්වරයෙකු ඇතුළු මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයකින් පැවැත්විය යුතු අතර එහි අනෙකුත් සාමාජිකයින් වශයෙන් සහකාර ප්‍රාදේශීය ලේකම්/ සැලසුම් සේවයේ නිලධරියෙකු/ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/ පරිපාලන නිලධාරී හෝ වෙනත් ඒ හා සමාන තනතුරක් දරන නිලධාරියෙකු ඇතුලත් කරගත යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පරීක්ෂණ සඳහා පත් කරන නිලධාරීන් තිදෙනා විසින් අදාල සියලුම කාර්යාල පරීක්ෂා කිරීම තුළින් විනිශ්චය කටයුතු සඳහා සාධාරණීකරණයක් ඉටුකරනු ඇතැයි අපේක්ෂා කරමි.

05. මෙම පරීක්ෂණයේදී ලකුණු ලබා දීම සඳහා මේ සමඟ අමුණා ඇති "ග්‍රාම නිලධාරි කාර්යාල කළමනාකරණ තරඟය" යන ආකෘති පත්‍රය ( ආකෘති පත්‍ර අංක 01) භාවිතා කරන්න. ලකුණු ලබා දීම අවසන් වූ පසු, ලබාගෙන ඇති මුළු ලකුණු ප්‍රමාණය පදනම් කරගෙන, එම කාර්යාලය, ආකෘති පත්‍රයෙහි සඳහන් පරිදි ශ්‍රේණිගත කරන්න. අනතුරුව එක් එක් ග්‍රාම නිලධාරි කාර්යාලය ලබා ගත් ශ්‍රේණිය අනුව මේ

සමඟ එවා ඇති "ග්‍රාම නිලධාරි කාර්යාල වර්ගීකරණය (ප්‍රාදේශීය මට්ටම)" ආකෘති පත්‍රයද ( ආකෘති පත්‍ර අංක 02 ) සම්පූර්ණ කරන්න.

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදුකරන ලද පරීක්ෂණ අවසානයේ, ග්‍රාම නිලධාරී කාර්යාල ලබාගෙන ඇති ලකුණු පදනම් කරගෙන ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව ග්‍රාම නිලධාරී කාර්යාල ලේඛනයක් සකස් කල යුතුය. එහිදී සම මට්ටමේ ලකුණු ලබා ගත් කාර්යාල ඇත්නම් ඒවා එකම මට්ටමේ අනුපිළිවෙල සහිත කාර්යාල වශයෙන් සලකා කටයුතු කල යුතු වේ.

07. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පරීක්ෂණ 2020 අගෝස්තු මස 01 දින ආරම්භ කොට 2020 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කල යුතුය.

08. ග්‍රාම නිලධාරී කාර්යාල ලබාගෙන ඇති ලකුණු පිළිවෙළ අනුව සකස් කරන ලද ලේඛනය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන ලබාගත් ග්‍රාම නිලධාරී කාර්යාල වලට අදාල කාර්යාල පරීක්ෂණ වාර්තාද ( ආකෘති පත්‍ර අංක 01 ) සමඟ "ග්‍රාම නිලධාරී කාර්යාල වර්ගීකරණය (ප්‍රාදේශීය මට්ටම)" යන ( ආකෘති පත්‍ර අංක 02) ආකෘති පත්‍රයද 2020.10.01 දිනට පෙර ලැබෙන සේ දිස්ත්‍රික් ලේකම් වෙත යැවිය යුතුය. ( විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීමට කටයුතු කරන්න )

09. එමෙන්ම කාර්යාල ලබාගෙන ඇති ලකුණු පිළිවෙළ අනුව සකස් කරන ලද ලේඛනයේ සහ "ග්‍රාම නිලධාරී කාර්යාල වර්ගීකරණය (ප්‍රාදේශීය මට්ටම)" යන ( ආකෘති පත්‍ර අංක 02) ආකෘති පත්‍රයේ පිටපතක් අමාත්‍යාංශයේ ග්‍රාම නිලධාරී පාලන අංශයටද ලැබෙන සේ එවිය යුතුය. ( විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීමට කටයුතු කරන්න )

10. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් ග්‍රාම නිලධාරි කාර්යාල සඳහා **ලබාගත් ස්ථානය සඳහන් කරමින්** සහතික පිරිනැමීමටත් , ලබා ගත් ලකුණු අනුපිළිවෙල අනුව සිව්වැනි ස්ථානයේ සිට දසවන ස්ථානය දක්වා වන කාර්යාල සඳහා කුසලතා සහතික පිරිනැමීමටද දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කල යුතුය.

11. කිසියම් නිලධාරියෙකු හට මෙම කාර්යාල පරීක්ෂාවේ දී තමාට අසාධාරණයක් වුවහොත් අභියාචනයක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත ඍජුව ඉදිරිපත් කලහැකි අතර, අමාත්‍යාංශයේ අභියාචනා කමිටුවක් මඟින් මූලික විනිශ්චය කටයුතු සිදුකල විනිශ්චය මණ්ඩලය සමඟ ගොස් නැවත පරීක්ෂාවක් සිදුකරනු ඇත.

**<u>දිස්ත්‍රික් මට්ටම</u>**

12. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථානය දිනාගත් ග්‍රාම නිලධාරි කාර්යාල දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පරීක්ෂාවට ලක් කෙරේ. එමෙන්ම තෙවන ස්ථානයත් හතර සහ පහ ස්ථාන ලබාගත් ග්‍රාම නිලධාරී කාර්යාල අතර පරතරය ලකුණු තුනකට වඩා අඩුවේ නම් හතර සහ පහ ස්ථාන ලබාගත් ග්‍රාම නිලධාරී කාර්යාලද පරීක්ෂා කල යුතුය.

13. මෙම දිස්ත්‍රික් මට්ටමේ පරීක්ෂණ, දිස්ත්‍රික් ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුකල යුතු අතර, දිස්ත්‍රික් මට්ටමේ පරීක්ෂණ මණ්ඩලය, අතිරේක දිස්ත්‍රික් ලේකම් සහ පළාත් සභාවට අනුයුක්තව රාජකාරී කරන I ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙකු ඇතුළු මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත විය

යුතු අතර එහි අනෙකුත් විනිශ්චය මණ්ඩල සාමාජිකයන් වශයෙන් සහකාර දිස්ත්‍රික් ලේකම්/ සැලසුම් සේවයේ නිලධාරියෙකු/ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/ පරිපාලන නිලධාරී හෝ ක්ෂේත්‍රයට අදාල ඒ හා සමාන නිලධාරියෙකු ඇතුලත් කරගත යුතුය. දිස්ත්‍රික් මට්ටමේ විනිශ්චය කටයුතු සඳහා පත්කරනු ලබන නිලධාරීන් තිදෙනා විසින් අදාල සියලුම පරීක්ෂාවන් සිදු කිරීම තුළින් විනිශ්චය කටයුතු සාධාරණීකරණය වනු ඇතැයි අපේක්ෂා කරමි.

14. දිස්ත්‍රික් මට්ටමේ සිදු කෙරෙන පරීක්ෂාව සඳහාද භාවිතා කල යුතු වන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙහිදී භාවිතා කල "ග්‍රාම නිලධාරී කාර්යාල කළමනාකරණ තරඟය" යන ආකෘති පත්‍රයම ( ආකෘති පත්‍ර අංක 01 ) වන අතර පරීක්ෂණය අවසානයේ ග්‍රාම නිලධාරී කාර්යාල වර්ගීකරණය සඳහා භාවිතා කල යුතු වන්නේ "ග්‍රාම නිලධාරී කාර්යාල වර්ගීකරණය (දිස්ත්‍රික් මට්ටම)" ( ආකෘති පත්‍ර අංක 03 ) යන ආකෘති පත්‍රයයි.

15. දිස්ත්‍රික් මට්ටමෙන් සිදු කෙරෙන පරීක්ෂණ 2020 ඔක්තෝබර් 01 දින සිට ආරම්භ කොට 2020 නොවැම්බර් මස 05 වන විට නිම කල යුතුය.

16. දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ලද පරීක්ෂණ අවසානයේ, එම කාර්යාල ලබාගෙන ඇති ලකුණු පදනම් කරගෙන ඉහලම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව ග්‍රාම නිලධාරී කාර්යාල ලේඛනයක් දිස්ත්‍රික් මට්ටමින් සකස් කල යුතු වේ. එම ලේඛනය හා දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රථම,දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් ග්‍රාම නිලධාරී කාර්යාල වලට අදාල කාර්යාල පරීක්ෂණ වාර්තාද සමඟ "ග්‍රාම නිලධාරී කාර්යාල වර්ගීකරණය (දිස්ත්‍රික් මට්ටම)" යන ( ආකෘති පත්‍ර අංක 03 ) ආකෘති පත්‍රයද 2020.11.10 දිනට පෙර අමාත්‍යාංශයේ ග්‍රාම නිලධාරී පාලන අංශයට ලැබෙන සේ එවිය යුතුය. ( විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීමට කටයුතු කරන්න )

17. දිස්ත්‍රික් මට්ටමේ කාර්යාල පරීක්ෂණ අවසානයේදී සකස් කරන, අනුපිළිවෙල ලේඛනය අනුව දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් ග්‍රාම නිලධාරී කාර්යාල සඳහා **ලබාගත් ස්ථානය සඳහන් කරමින්** සහතික පිරිනැමීමටත් , ලබා ගත් ලකුණු අනුපිළිවෙල අනුව සිව්වැනි ස්ථානයේ සිට දස වැනි ස්ථානය දක්වා කුසලතා සහතික පිරිනැමීමටද දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කල යුතුය.

18. දිස්ත්‍රික් මට්ටමේ පරීක්ෂණ වලදී තම කාර්යාල පරීක්ෂාවේ දී අසාධාරණයක් වුවහොත් අමාත්‍යාංශ ලේකම් වෙත ඒ පිළිබඳව සෘජුව අභියාචනා කල හැකි අතර, අමාත්‍යාංශ අභියාචනා කමිටුව විසින් දිස්ත්‍රික් විනිශ්චය කටයුතු සිදු කල විනිශ්චය මණ්ඩලය ද සමඟ ගොස් නැවත පරීක්ෂාව සිදු කරනු ඇත.

<u>ජාතික මට්ටම</u>

19. දිස්ත්‍රික් මට්ටමේ ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථානය ලබා ගත් ග්‍රාම නිලධාරී කාර්යාල, අමාත්‍යාංශය මඟින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පරීක්ෂාවට ලක් කරන අතර එමඟින් ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා කාර්යාල තෝරාගනු ලැබේ.

20. ජාතික මට්ටමෙන් සිදු කෙරෙන පරීක්ෂණ 2020.11.10 දින සිට ආරම්භ කොට 2020.12.31 වන විට නිම කිරීමට කටයුතු කරනු ඇත.

21. දිස්ත්‍රික් විනිශ්චය කටයුතු වලදී ලකුණු ලබා දීමේ කාර්යයෙහි දී යම් නිලධාරියෙකුට අසාධාරණයක් සිදු වූයේ නම්, ඒ සම්බන්ධයෙන් වන අභියාචනා "ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, නිල මැදුර, ඇල්විටිගල මාවත, කොළඹ 05" යන ලිපිනයට සෘජුවම යොමු කල හැකිය. ඒ සම්බන්ධව සියළුම ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන්න.

22. මෙම වැඩසටහනට අදාලව ජාතික මට්ටමෙන් පවත්වනු ලබන උත්සවයක් මඟින් විශිෂ්ඨතා සහ කුසලතා ඇගයීමට ලක් කෙරෙනු ඇත.

23. රජය මඟින් නිල සෙවණ කාර්යාල, ඇතැම් ග්‍රාම නිලධාරීන් වෙත ලබා දී ඇති බැවින් ද, සමහර කාර්යාල වල උපකරණ බොහෝ සේ අබලන් වී ඇති බැවින් ද, පෞද්ගලික ස්ථාන වල පවත්වාගෙන යන කාර්යාල වල බිත්ති වල දැන්වීම් පුවරු ආදිය ඇලවීමට ඉඩ නොදීම වැනි කරුණු හේතුවෙන් යම් පිරිසකට අසාධාරණයක් සිදුවිය හැකි බැවින්, කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ලකුණු ලබා දීමේ දී ඒ සම්බන්ධව ද සැලකිලිමත් වන්න.

24. සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයකම සිදු කෙරෙන පරීක්ෂාවේ දී භාවිත කරන "ග්‍රාම නිලධාරී කාර්යාල කළමනාකරණ තරඟය" යන ආකෘති පත්‍රයේ (ආකෘති පත්‍ර අංක 01) හි ඇති අවම ප්‍රමිති නිර්ණායකයන් සෑම කාර්යාලයකම සපුරා තිබීම අපේක්ෂා කරන බැවින්, ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.

25. තවද මෙම ග්‍රාම නිලධාරී කාර්යාල කළමනාකරණ තරඟය සඳහා ඉදිරිපත් වීමේ දී ඵලදායිතා සංවර්ධන නිලධාරීන්ගේ ද සහය ලබා ගත හැකිය.

**26. මේ පිළිබඳව ඔබ දිස්ත්‍රික්කයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියළුම ග්‍රාම නිලධාරින් හා අදාල නිලධාරින් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.**

එස්.හෙට්ටිආරච්චි

ලේකම්

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු සහ පළාත්

සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

23/01/2020